# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1913/19 - 2015 මැයි මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2015.05.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

**454 වන අධිකාරය වන රජයේ ඉඩම් ආඥාපනත**

6 වන වගන්තිය යටතේ කරන ලද විශේෂ ප්‍රදානය ප්‍රත්‍යාදිෂ්ට කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමන් විසින් 2012 ජූලි මස 19 වැනි දිනැති අංක 4/10/35833 දරන සාධන පත්‍රය මගින් එහි සවිස්තරව දක්වා ඇති ඉඩම් හා පරිශ්‍රයන් කොළඹ 01, ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයෙහි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත පවරා දෙන ලද බැවින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, 2012 ජූලි මස 19 වැනි දිනැති පූර්වෝක්ත විශේෂ ප්‍රදානය මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කර, අවලංගු කර අහෝසි කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති.

2015 මැයි මස 07 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

---

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත**

22 අ වගන්තිය යටතේ කරන ලද අධිකරණ නියෝග ප්‍රත්‍යාදිෂ්ට කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 22අ වගන්තියෙහි උප වගන්තිය (2) යටතේ කරන ලදුව 2012 මැයි මස 17 වැනි දින අංක 1758/26 දරන *ගැසට් පත්‍රයෙහි (අති විශේෂ)* පළකරන ලද බැර කර්මාන්ත සඳහා නිශ්චිතව දක්වා ඇති කලාපය ප්‍රකාශයට පත් කෙරෙන *ගැසට් නිවේදනය* මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති.

2015 මැයි මස 07 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

1A - G 21293 — 31 (2015/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*